# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සුහුරුපාය , බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120
ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635
දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)
වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk
ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 1817/2024
ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024
දිනය / திகதி / Date – 08/12/2024 පැය 1005

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

**01. නීති විරෝධි මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පූගොඩ කඳවුර.**

2024.12.07 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පූගොඩ කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් පූගොඩ පොලිස් වසමේ මණ්ඩාවල ප්‍රදේශයේ වැටලීමක් සිදුකර **නීති විරෝධි මත්පැන් ලීටර් 17.85 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන පූගොඩ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 53 ක් වන රදාවාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පූගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පුත්තලම කඳවුර.**

2024.12.07 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පුත්තලම කඳවුර නිලධාරීන් කණ්ඩායමක් විසින් පුත්තලම පොලිස් වසමේ පාලවිය ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 500 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන පුත්තලම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 42 ක් වන පාලවිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

පුත්තලම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි

**03. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මහනුවර කඳවුර.**

2024.12.07 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා මහනුවර කඳවුර නිලධාරීන් කණ්ඩායමක් විසින් මහනුවර පොලිස් වසමේ පේරාදෙනිය ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 40 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන මහනුවර පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 44 ක් වන කිරිබත්කුඹුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මහනුවර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මහනුවර කඳවුර.**

2024.12.07 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා මහනුවර කඳවුර නිලධාරීන් කණ්ඩායමක් විසින් මහනුවර පොලිස් වසමේ සුදුහුම්පල ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 60 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන මහනුවර පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 46 ක් වන දංගොල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මහනුවර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි

**05. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පුලියන්කුලම කඳවුර**

2024.12.07 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පුලියන්කුලම කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ඕමන්ත පොලිස් වසමේ කොන්දකාරකුලම් ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ** තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඕමන්ත පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 48 වන ඉලුප්පඩිකුලම් ප්‍රදේශයේ පදිංචිකරුවෙක් වේ.**

ඕමන්ත පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි

**06. විකිණීම සඳහා සන්තකයේ තබා ගෙන සිටි වාලම්පුරි සමඟ සැකකරුවන් දෙදෙනෙක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පුත්තලම කඳවුර**

2024.12.07 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා පුත්තලම කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මාදම්පේ හා වෙන්නප්පුව පොලිස් වසම්වලදී වැටලීම් දෙකක් සිදුකර **විකිණීම සඳහා සන්තකයේ තබා ගෙන සිටි වාලම්පුරි 04 ක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු** අත්අඩංගුවට ගෙන කරුවලගස්වැව වනජීවී කාර්යාලය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 41 හා 42 වයස්වල පසුවන මාදම්පේ හා වෙන්නප්පුව ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

මෙම වැටලීමට අදාල ඡායාරූප කිහිපයක් මේ සමඟ ඔබ වෙත එවමි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**